2019 දෙසැම්බර් 11 දින "ඊක්වල් ග්‍රවුන්ඩ්" (Equal Ground) ආයතනය විසින් පැවැත්වූ ජාත්‍යන්තර මානව හිමිකම් දිනය 2019 සැමරුමේදී තානාපතිනී ඇලයිනා බී. ටෙප්ලිට්ස් විසින් පැවැත්වූ දේශනය

ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම සඳහා අද රාත්‍රියේ කතා කිරීමට මට ආරාධනා කිරීම ගැන 'ඊක්වල් ග්‍රවුන්ඩ්' සංවිධානයට ස්තුති කිරීමට කැමැත්තෙමි. ඇත්ත වශයෙන්ම එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට එරෙහි දින 16 ක ක්‍රියාකාරිත්වයේ අවසාන දිනයයි.

රොසනා අපට පැවසූ පරිදි, මානව හිමිකම් සුරැකීමේ හා ආරක්ෂා කිරීමේ අරගලය අලුත් එකක් නොවේ. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත කරන ලද්දේ 1948 දෙසැම්බර් 10 වන දින වන අතර, එය සරල, ප්‍රබල අදහසක් ප්‍රකාශ කරයි: සියලු මනුෂ්‍යයන් නිදහස්ව හා ගෞරවයෙන් හා අයිතිවාසිකම්වලින් සමානව උපදින අය බවයි. මෙම බලගතු ප්‍රකාශනයෙන් වැඩි ආරක්ෂාව, නිදහස සහ යුක්තිය මෙන්ම ආර්ථික හා සමාජ ප්‍රගතිය සඳහා වූ ගෝලීය ප්‍රජා අපේක්ෂාවන්ට මග පෙන්වයි.

එබැවින් සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාවූ අපගේ විධිමත් ගෝලීය කැපවීම අලුත් දෙයක් නොවේ. අප තවමත් එය සාක්ෂාත් කර ගෙන නැති නමුත් එය අප ළඟා කර ගැනීමට අපේක්ෂා කරන ඉලක්කයක් වේ.

තවත් කළ යුතු වැඩ කටයුතු තිබුණත් සැමරිය හැකි ප්‍රගතියක්ද තිබේ. මානව හිමිකම් ප්‍රකාශනය සම්මත වූ දා සිට ලොව පුරා රටවල් මානව හිමිකම් හා මානව යථාර්ථය සම්බන්ධයෙන් විශාල දියුණුවක් ලබා ඇත.

මීට වසර ගණනාවකට පෙර ලෝකය එකට එකතු වූයේ අපගේ හවුල් සාරධර්ම හඳුනාගෙන ඒවා සාක්ෂාත් කර ගන්නේ කෙසේද යන්න තීරණය කිරීම සඳහා ය. මෙය 1948 දී වැදගත් පියවරක් විය, නමුත් හරය වශයෙන් ගත් කළ පළමු ප්‍රකාශනය සංකල්පීය රාමුවක් පමණි. බිමි මට්ටමේ යථාර්ථය අවබෝධ කර ගැනීමට එය අපට උපකාරී වූයේ නැත. සෑම මිනිසෙකුටම හිමි අයිතිවාසිකම් පිළිබඳ අපගේ සාමූහික අවබෝධය සමඟ අප ඉදිරියට යා යුතුය.

ජාත්‍යන්තර ප්‍රජාව මෙම මූලධර්ම මත පදනම්ව මානව හිමිකම් ගිවිසුම් හා සම්මුතීන් ගණනාවක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත්තේ ඒ මගින් මුල් ප්‍රකාශනය වැඩි දුර පැහැදිලි කිරීම සඳහාය. මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇති නමුත් ඒ සඳහා ඉතා දිගු කාලයක් ගතවී තිබේ. ඇත්ත වශයෙන්ම ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගතවී ඇත්තේ අපගේ අරමුණු හා ඉලක්ක කාලීය අවශ්‍යතා අනුව වෙනස් කිරීමට සිදුවී ඇති බැවිනි.

මේ අනුව මීට අවුරුදු 20 කට පෙර ලෝක ජනතාව යළිත් හමුවී සහශ්‍ර සංවර්ධන ඉලක්කවලට එකඟ විය. මෙය, පරිසරය ආරක්ෂා කරමින් දරිද්‍රතාවයට එරෙහිව සටන් කරන අතරම සාමය සහ ආරක්ෂාව, සංවර්ධනය සහ මානව හිමිකම් ඉදිරියට ගෙන යාම සඳහාවූ අභිලාෂකාමී ජාත්‍යන්තර වැඩසටහනක් වූයේය.

නිදසුනක් වශයෙන්, මාතෘ සෞඛ්‍යය වැඩිදියුණු කිරීම, විශ්ව ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගැනීම, දරිද්‍රතා අනුපාතය අඩකින් අඩු කිරීම, මැලේරියාව තුරන් කිරීම සහ ළමා මරණ සංඛ්‍යාව අඩු කිරීම සහ සහශ්‍ර සංවර්ධන අරමුණු (MDGs) සඳහා කැපවීම ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දැවැන්ත ප්‍රගතියක් ලබා ඇත.

මෙම ප්‍රගතිය ප්‍රමාණවත් නොවූ හෙයින්, එය තවත් ඉදිරියට ගෙන යෑම සඳහා 2015 දී ලෝක ජනතාව යළිත් එක් වී තිරසාර සංවර්ධන ඉලක්ක වලට එකඟ විය. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) යනු සෑම කෙනෙකුටම වඩා හොඳ අනාගතයක් අත් කර ගත හැකි ක්‍රමයකි. තිරසාර සංවර්ධන ඉලක්ක න්‍යාය

පත්‍රයට කැපවීම සඳහා ශ්‍රී ලංකාව අනෙකුත් ජාතීන් සමඟ එක් වූ අතර ඒවා ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමට ක්‍රියාකාරී පියවර ගෙන තිබේ. ජනාධිපති රාජපක්ෂ මහතා ඔහුගේ සමාරම්භක දේශනයේදී මෙම අරමුණු වෙනුවෙන් දිගටම කැපවෙන බව ප්‍රකාශ කිරීම මට සතුටට හේතු විය.

ප්‍රශස්ත තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17 ක් ඇති නමුත් මා මෙහිදී විශේෂයෙන් කථා කිරීමට බලාපොරොත්තු වන්නේ 10 සහ 16 වන ඉලක්ක පිළිබඳවයි. පළමුවෙන්ම තිරසාර සංවර්ධන ඉලක්ක 16 සඳහා වන ප්‍රකාශය ඔබ සමඟ බෙදාහදා ගැනීමට මට අවශ්‍යයි. එහි සඳහන් වන්නේ "තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියල්ලන් ඇතුළත් සමාජ ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සහ සියලු මට්ටම්වල ඵලදායී, වගවීමක් ඇති සහ සියල්ලන් ඇතුළත් ආයතන ගොඩනැගීම." යනුවෙනි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා පොලීසිය සහ අධිකරණය වැනි තීරණාත්මක ආයතන ඇතුළුව සමාජීය පරාසය පුරා ආයතනවල ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. වින්දිතයින්ට නිසි ලෙස සැලකීම, රැඳවියන්ට සහ සැකකරුවන්ට මානුෂිකව සැලකීම සහ විනිවිද පෙනෙන, සාක්ෂි පදනම් කරගත් නඩු පැවරීම් තුළින් මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් අපයෝජනය කරන අය හා මානව හිමිකම් උල්ලංඝනයන් හඳුනාගෙන ඒවා අවසන් කිරීම සඳහා වඩා හොඳ හැකියාවක් ඇති නීතිය බලාත්මක කිරීමේ සහ අධිකරණ ආයතන ශ්‍රී ලංකාව වැනි රටවලට අවශ්‍ය වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 16 සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් වන තවත් ආයතනයක් වන්නේ මාධ්‍යයි. ඕනෑම තැනක සිදුවන උල්ලංඝනයන් වඩා හොඳින් වාර්තා කිරීමට සහ ගැටළු සහ විභව විසඳුම් පිළිබඳව මහජනතාව පුළුල් වශයෙන් දැනුවත් කිරීමට ඔවුන්ට හැකි වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක 10 අපේක්ෂා කරන්නේ "රටවල් තුළ සහ ඒවා අතර අසමානතා අවම කිරීම" යි. වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, සමාජ තත්වය, ලිංගික නැඹුරුව, හෝ ශාරීරික හැකියාවන් කුමක් වුවත් 2030 වර්ෂය වන විට සියලු දෙනාම සමාජීය, ආර්ථික හා දේශපාලනික වශයෙන් සවිබලගැන්වීමටත් , ප්‍රවර්ධනය කිරීමටත් සියලුම රටවල් ක්‍රියා කළ යුතු වේ. මෙය අප කොතැනක සිටියත් අප සියලු දෙනාටම පුද්ගලිකව සහ ආයතනික වශයෙන් අවධානය යොමු කිරීමට උපකාර කළ හැකි දෙයකි.

2030 වන විට සියලු දෙනාටම සම අවස්ථා අප විසින් සහතික කළ යුතු අතර පුද්ගලයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය හෝ වර්ණය, ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ බහුතරයෙන් ඔවුන් වෙන් කරන වෙනත් සාධක මත පදනම්ව සමාජයේ යාන්ත්‍රණයන්ට දායක වීම සහ ප්‍රතිලාභ ලබා ගැනීම වළක්වන බාධක අපි අඩු කළ යුතු වෙමු.

මානව හිමිකම් ආරක්ෂා කිරීම, අපට කළ හැකි නිවැරදි දෙය බව මම විශ්වාස කරමි. එය සදාචාරාත්මකව නිවැරදි දෙයයි, එය ආචාර ධර්මීය ලෙසත් නිවැරදි දෙයයි. එය ආර්ථික දෘෂ්ටිකෝණයකින් නිවැරදි දෙයයි. එකිනෙකාට ගරු කිරීම අපගේ සමාජයන් යහපත් කරවන අතර එය ඔවුන් ධනවත් කරයි. එය අපගේ මානව අන්තර්ක්‍රියා අනුව පොහොසත් වීමක් පමණක් නොව වචනාර්ථයෙන් ධනවත් වීමකි. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම රජයේ මැදිහත්වීමෙන් පමණක් සිදු නොවේ. මානව හිමිකම් අරමුණු සාක්ෂාත් කර ගැනීමේ සාර්ථකත්වය පිළිබඳ අපේ අපේක්ෂාවන්ට ආර්ථික සංවර්ධනය අත්‍යවශ්‍ය වේ.

මම ඔබට කියන්නේ කුමක්ද? මානව හිමිකම් කෙරෙහි ඇති ගෞරවය තුළින් ආර්ථික සංවර්ධනයක් ලබා ගත හැකි බවයි. ඒවා තිරසාර සංවර්ධන ඉලක්ක ලෙස හඳුන්වන්නේ එබැවිනි.

මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම ආර්ථික වර්ධනය සඳහා වැදගත් සාධකයක් වන අතර, සියල්ලන් ඇතුළත් ආර්ථිකයන් වඩා ශක්තිමත් හා කල් පවතින ඒවා බව ඔප්පු වී ඇත. ශ්‍රී ලංකාව ගෝලීය ආර්ථිකයට වැඩි වැඩියෙන් සම්බන්ධ වී ඇති අතර බහුජාතික සමාගම් ඔවුන්ගේ කීර්ති නාමයට ඇති අවදානම ගැන වැඩි වැඩියෙන් සැලකිලිමත් වේ. අර්ථවත්, ආයතනික ප්‍රතිසංස්කරණ තුළින් මූලික

අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙන් ඔවුන්ගේ කීර්ති නාමයට අවදානමක් නැති බවත් එමනිසා ශ්‍රී ලංකාව ආයෝජනය කිරීමට හොඳ ස්ථානයක් බවත් ආයෝජකයින්ට සහතික කෙරේ.

බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද තිරසාර සංවර්ධන ඉලක්ක 10 හා 16 යන දෙකම සාක්ෂාත් කර ගැනීමේ පළමු පියවර වන්නේ වෙනස් කොට සැලකීමේ නීති, ප්‍රතිපත්ති සහ භාවිතයන් ඉවත් කිරීමයි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ වර්තමාන කම්කරු නීති, ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ වෙනස් ලෙස සැලකීම් පැහැදිලිවම තහනම් නොකරයි. කම්කරු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමෙන් බඳවා ගැනීමේදී වෙනස් කොට සැලකීම තුරන් කිරීම ශ්‍රී ලංකාවේ පුළුල් ආර්ථික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහායක් වනු ඇත.

ලිංගිකත්වය සහ ලිංගික දිශානතිය මත පදනම් වූ අසමානතා ලොව පුරා අඛණ්ඩව පවතින බව අපි දනිමු. මෙම අසමානතාව දිගුකාලීන සමාජ හා ආර්ථික සංවර්ධනයට බාධා කරයි. එය දරිද්‍රතාවය අවම කිරීමට හානි කරන අතර මිනිසුන්ගේ සන්තෘප්තිය සහ ස්වයං-වටිනාකම පිළිබඳ හැඟීම් විනාශ කරයි.

2030 වන විට සෑම රටක් විසින්ම සියලු ජනතාව සඳහා වැඩි සමානාත්මතාවක් ලබා ගැනීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ඇතුළු ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුව තිබේ. තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා එකඟ වූ සියලු රටවල් කැපවී සිටින්නේ ඒ සඳහායි. ශ්‍රී ලංකාවට මෙය කළ හැකි බව මම දනිමි.

අද මට අවශ්‍ය වන්නේ ලොව පුරා මානව ගරුත්වය හා සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම හා ඉදිරියට ගෙනයාම සඳහා වන ඇමරිකානු කැපවීම නැවතත් තහවුරු කිරීමයි. මිනිස් පවුලේ සියලුම සාමාජිකයින්ගේ සහජ ගෞරවය හා සමානාත්මතාව සහ අහිමි කළ නොහැකි අයිතිවාසිකම්, නිදහසේ, යුක්තියේ සහ සාමයේ පදනමයි.

ආන්තික හා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ආධාර කිරීම සහ සහාය දීම මගින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ඉදිරියට ගෙන යාමේ දීර්ඝ ඉතිහාසයක් එක්සත් ජනපදයට තිබේ. අයිතිවාසිකම් සහ සවිබල ගැන්වීම සහ ප්‍රතිපත්ති භාවිතයන් සහ මූලාරම්භයන් ඒකාබද්ධ කිරීම තුළින් අපි විවිධ ලිංගික නැඹුරුවන් සහිත කොටස්වල (LGBTIQ) සමානාත්මතා උත්සාහයන් අඛණ්ඩව ප්‍රවර්ධනය කරන්නෙමු.

ඒ නිසා ඔබට සිතා බැලීමට යමක් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කිරීමට ඉඩ දෙන්න. 1948 නිදහස පිළිබඳ ප්‍රඥප්තිය නිර්මාණය කිරීමේ ගාමක බලවේගයක් වූ එලනෝර් රූස්වෙල්ට්ගෙන් උපුටා දැක්වීමක් මම ඔබට ඉදිරිපත් කරමි. ඇය මානව හිමිකම් නායිකාවක් වූවාය. ඇය මෙසේ පැවසුවාය: "විශ්වීය මානව හිමිකම් ආරම්භ වන්නේ කොතැනින්ද? කුඩා ස්ථානවල හෝ නිවසට සමීපවයි - ඒවා ලෝකයේ කිසිදු සිතියමක දැකිය නොහැකි තරම් සමීප හා කුඩා ස්ථාන වේ. නමුත් ඒවා තනි පුද්ගලයාගේ ලෝකය යි; ඔහු ජීවත් වන අසල්වැසි පරිසරයයි; ඔහු අධ්‍යාපනය ලබන පාසල හෝ විද්‍යාලයයි; ඔහු සේවය කරන කර්මාන්ත ශාලාව, ගොවිපල හෝ කාර්යාලයයි. සෑම පිරිමියෙක්ම, ස්ත්‍රියක් හා දරුවෙක්ම සමාන යුක්තිය, සමාන අවස්ථාව, වෙනස් ලෙස සැලකීමෙන් තොරව සමාන ගෞරවය අපේක්ෂා කරන ස්ථාන ඒවායි. මෙම අයිතිවාසිකම්වලට එවැනි ස්ථානවල අර්ථයක් නොමැති නම්, ඒවාට කොතැනකවත් අර්ථයක් නැත. පුරවැසියන්ගේ නිවෙස්වලට සමීපව ඒවා පවත්වා ගැනීම සඳහා සාමූහික පුරවැසි ක්‍රියාමාර්ගයක් නොගන්නේ නම, පිටස්තර විසල් ලෝකයේ ඒවායේ ප්‍රගතිය සොයා බැලීම නිෂ්ඵල ක්‍රියාවක් වනු ඇත."

එලිනෝර් රූස්වෙල්ට්ගේ වචන අදටත් සත්‍ය වේ.

සමානාත්මතාව ඉදිරියට ගෙනයාම, වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීම සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම සඳහා 'ඊක්වල් ග්‍රවුන්ඩ්' සහ අනෙකුත් සංවිධාන විසින් දරන ලද උත්සාහය මම අගය කරමි. තිරසාර සංවර්ධන අරමුණු වල දක්වා ඇති දැක්ම සාක්ෂාත් කර ගැනීම රජයට පමණක් කළ හැකි දෙයක් නොවේ. කිසිවෙකු අත්හැර දැමීමට ලක් නොවූ අනාගතයක් නිර්මාණය කිරීමට අප සැවොම උර දීම අවශ්‍ය වනු ඇත.

ඔබට ස්තූතියි.